යම්කිසි වරදකට ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම අත්අඩංගුවට ගන්නා අවස්ථාවක, එකී වරදට චෝදනා ලබන කාන්තා පාර්ශවය පමණක් ඉස්මතු කරමින් පුවත් වාර්තා කිරීම ඇතැම් විට දක්නට ලැබේ.

"කසිප්පු වටලන්න ගිය විට පොලීසියට කාන්තා ප්‍රහාරයක්" මැයෙන් අරුණ පුවත්පතේ (11/01) වාර්තා වූ සිරස්තලය ඊට උදාහරණයකි.

1. ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම අත්අඩංගුවට ගනු ලැබූ අවස්ථාවක, මෙලෙස කාන්තා පාර්ශවය පමණක් ඉස්මතු කොට සඳහන් කිරීම, කාන්තාවන්ට එකී වරදෙහි වැඩි වගකීමක් පැවරීමක් යැයි ඔබ සිතන්නේ ද?

2. එය ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගෙන කරනු ලබන කොන් කිරීමක් නොවන්නේ ද?

3.ඉහත සඳහන් සිරස්තලය වෙනුවට, "කසිප්පු වටලන්න ගිය පොලිසියට ප්‍රහාරයක්: සිව්දෙනෙකු අත්අඩංගුවට" හෝ "කසිප්පු වටලන්න ගිය පොලිස් නිළධාරීන්ට පහර දුන් කාන්තා සහ පිරිමි සියළුදෙනා අත්අඩංගුවට" වැනි විකල්ප සිරස්තල පිළිබඳ ඔබේ අදහස කුමක්ද ?